SRI LANKA

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# අදියර I විභාගය - 2025 ජනවාරි

# යෝජිත උත්තර

# (103) ආර්ථික විද්‍යාව (ECN)


ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථන: 011-2-559 669



**මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි**

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අධියර I විභාගය - 2025 ජනවාරි

# (103) ආර්ථික විද්‍යාව

# යෝජිත උත්තර

(මුළු ලකුණු 40) **A කොටස**

## පළමුවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර:

**1.1** (2)

**1.2** (4)

**1.3** (1)

**1.4** (1)

**1.5** (2)

**1.6** (3)

**1.7** (4)

**1.8** (1)

**1.9** (1)

**1.10** (2)

**1.11** හිඟකම

**1.12** නම්‍ය

**1.13** සත්‍ය

**1.14** අසත්‍ය

**1.15** මූලික ආර්ථික ප්‍රශ්න තුන

- කුමක් කොපමණ නිපදවනවාද?
- කෙසේ නිපදවනවාද?
- කා සඳහා නිපදවනවාද?

**1.16** සැපයුම් වක්‍රය දකුණට විතැන් වීමට බලපාන සාධක

- සම්බන්ධිත භාණ්ඩවල මිල අඩු වීම
- භාණ්ඩය නිපදවීමට යොදා ගන්නා නිෂ්පාදන සාධක වල මිල අඩු වීම
- තාක්ෂණය දියුණු වීම
- වෙළඳපොලේ සිටින සැපයුම්කරුවන් සංඛ්‍යාව වැඩි වීම
- රජය පැනවූ බදු අඩු කිරීම හෝ ඉවත් කිරීම

- රජය විසින් නිෂ්පාදකයන්ට සහනාධාර ලබාදීම
- භාණ්ඩයේ මිල අනාගතයේ දී අඩු වනු ඇතැයි නිෂ්පාදකයින් අපේක්ෂා කිරීම

**1.17 කෙටි කාලීන නිෂ්පාදනය** - නිෂ්පාදනයේ යොදා ගන්නා ස්ථාවර සාධක ප්‍රමාණය වෙනස් කළ නොහැකි සහ විචල්‍ය සාධක පමණක් වෙනස් කළ හැකි කාල සීමාව කෙටි කාලීන නිෂ්පාදනය ලෙස හැඳින්වේ.

**දිගු කාලීන නිෂ්පාදනය** නිෂ්පාදනයේ යොදා ගන්නා ස්ථාවර සාධක ප්‍රමාණය විචල්‍ය සාධක බවට පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය වන කාලය දිගු කාලීන නිෂ්පාදනය ලෙස හැඳින්වේ.

**1.18 පූර්ණ තරගකාරී ආයතනයක ලක්ෂණ**

- සමජාතීය භාණ්ඩ නිෂ්පාදනය
- වෙළඳපොල තුල ගැණුම්කරුවන් සහ විකුණුම්කරුවන් අති විශාල ප්‍රමාණයක් සිටීම
- ආයතනය මිල ගනුවෙක් වීම
- අබාධ ප්‍රවේශය සහ පිටවුමක් පැවතීම
- පූර්ණ තොරතුරු පැවතීම
- පූර්ණ සාධක සංචලතාවය
- දිගු කාලයේදී ආර්ථික ලාභ ශුන්‍ය වීම

**1.19 ගෙවුම් ශේෂ ලේඛනයේ ජංගම ගිණුමේ වාර්තා කරන ගනුදෙනු/අයිතම**

- භාණ්ඩ අපනයන හා ආනයන
- සේවා අපනයන හා ආනයන
- ප්‍රාථමික ආදායම් ලැබීම් හා ගෙවීම්
- ද්විතියික ආදායම් ලැබීම් හා ගෙවීම්
- වෙළඳාම සහ සේවා

**1.20**

ආර්ථික සංවර්ධනය යන්නෙන් අදහස් කරන්නේ මිනිස් ජීවිතයේ සියලු අංශවල, වඩාත් වැදගත් ලෙස ආර්ථික, දේශපාලනික, සමාජීය සහ සංස්කෘතික අංශවල ප්‍රමාණාත්මක හා ගුණාත්මක දියුණුව වන අතර සංවර්ධනය බහුමාන ක්‍රියාවලියකි.

ආර්ථික සංවර්ධනය යනු ආර්ථික වර්ධනයේ පරිණාමීය ක්‍රියාවලියකි. මෙයින් ගම්‍ය වන්නේ ආර්ථික සංවර්ධනය ආර්ථික වර්ධනයත් සමඟ සිදුවන ආර්ථික ව්‍යුහයේ වෙනස්කම් පිළිබිඹු කරන බවයි.

*(එක් කොටසකට ලකුණු 02 , මුළු ලකුණු 40 යි)*

***A කොටසෙහි අවසානය***

## *දෙවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

**(a) වෙළඳපොළ ආර්ථිකයක මූලික ලක්ෂණ**

- මිල යාන්ත්‍රණය හරහා මූලික ආර්ථික ප්‍රශන විසඳා ගැනීම
- පෞද්ගලික දේපළ අයිතිය පැවතීම
- පෞද්ගලික ව්‍යවසායන් පැවතීම
- රජයේ මැදිහත්වීම අවම මට්ටමක පැවතීම
- පාරිභෝගික ස්වාධිපත්‍ය පැවතීම
- වෙළඳපොල තරගකාරීත්වය පැවතීම
- තෝරාගැනීමේ නිදහස පැවතීම

*(ලකුණු 03)*

**(b) වෙළෙඳපොළ සමතුලිතය**

Qd = 250 – 10p

Qs = -50 +15p

| මිල (රු.) | ඉල්ලුම් ප්‍රමාණය | සැපයුම් ප්‍රමාණය |
|---|---|---|
| 2 | 230 | -20 |
| 4 | 210 | 10 |
| 6 | 190 | 40 |
| 8 | 170 | 70 |
| 10 | 150 | 100 |
| **12** | **130** | **130** |
| 14 | 110 | 160 |

සමතුලිත මිල = රු.12.00

සමතුලිත ප්‍රමාණය = ඒකක 130

*(ලකුණු 04)*

**(c)** පාරිභෝගික අතිරික්තය = $\frac{(\text{උපරිම ඉල්ලුම් මිල - සමතුලිත මිල}) \times \text{සමතුලිත ප්‍රමාණය}}{2}$

$$= \frac{(25 - 12) \times 130}{2}$$

= රු. 845.00


*(ලකුණු 03)*

*(මුළු ලකුණු 10 යි)*

## *තුන්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

**(a)** උපරිම මිල පැනවීමේ ආර්ථික ප්‍රතිවිපාක

වෙළඳපොල සමතුලිතය මගින් තීරණය වූ මිල පාරිභෝගිකයන්ට අසාධාරණ බව රජය තීරණය කල විට එම භාණ්ඩය අලෙවි කල හැකි මිල නීතියෙන් නියම කිරීම උපරිම මිල පැනවීම ලෙස හැඳින්වේ.




$P_0$ = සමතුලිත මිල

$Q_0$ = සමතුලිත ප්‍රමාණය

$P_1$ = උපරිම මිල සීමාව

$Q_1$ = උපරිම මිල යටතේ සැපයුම් ප්‍රමාණය

$Q_2$ = උපරිම මිල යටතේ ඉල්ලුම් ප්‍රමාණය

$(Q_2 - Q_1)$ = උපරිම මිල යටතේ අධි ඉල්ලුම

$P_2$ = කළුකඩ මිල

- උපරිම මිල සීමාව පැනවීම නිසා ඉල්ලුම් ප්‍රමාණය $Q_0$ සිට $Q_2$ දක්වා වැඩි වන අතර සැපයුම් ප්‍රමාණය $Q_0$ සිට $Q_1$ දක්වා අඩු වේ.
- මෙමගින් $(Q_2 - Q_1)$ ප්‍රමාණයක අධි ඉල්ලුමක් හෙවත් භාණ්ඩ හිඟයක් නිර්මාණය වේ.
- භාණ්ඩ හිඟ වීම නිසා නීතියෙන් නියම කල උපරිම මිල සීමාව ඉක්මවා කළුකඩ මිලක් නිර්මාණය වේ.
- වෙළඳපොල ඇතිවන භාණ්ඩ හිඟය ඉවත් කිරීම සඳහා රජය පහත පියවර ගත යුතුය.
  - ආනයනය
  - නිෂ්පාදකයන්ට සහනාධාර ලබාදීම
  - මිල නොවන සලාකන ක්‍රම ක්‍රියාත්මක කිරීම
- රජය පාරිභෝගිකයින්ගේ යහපැවැත්ම ගැන සැලකිලිමත් වන විට උපරිම මිල පනවනු ලබන අතර එම නිසා උපරිම මිල පැනවීමෙන් පසු පාරිභෝගික අතිරික්තය වැඩි වන අතර නිෂ්පාදක අතිරික්තය අඩු වේ. කෙසේ වෙතත් උපරිම මිල හඳුන්වාදීමෙන් පසු වෙළඳපොළක හුවමාරු වන භාණ්ඩ හෝ සේවා ප්‍රමාණයේ අඩුවීමක් සිදුවන අතර එමගින් සමස්ත ආර්ථික අතිරික්තය අඩු වේ. අතිරික්තයේ මෙම අඩුවීම සුභසාධන අලාභය හෝ සමාජ පිරිවැය ලෙස හැඳින්වේ.

*(ලකුණු 06)*

SRI LANKA

**(b)** ගිණුම්කරණ සහ ආර්ථික ලාභය

ආදායම = විකුණුම් මිල × විකුණුම් ඒකක

= රු.50 × 1,000 ඒකක

= රු.50,000

| සෘජු පිරිවැය (රු.) | | | වක්‍ර පිරිවැය (රු.) | | |
|---|---|---|---|---|---|
| අමුද්‍රව්‍ය පිරිවැය | = | 5,000 | ආර්ථික ක්ෂය වීම් | = | 1,200 |
| සෘජු ශ්‍රම පිරිවැය | = | 500 | | | |
| අනෙකුත් සෘජු පිරිවැය | = | 750 | | | |
| **මුලු සෘජු පිරිවැය** | **=** | **6,250** | **මුලු වක්‍ර පිරිවැය** | **=** | **1,200** |
| | | | | | |

**ගිණුම්කරණ ලාභය = මුලු අයභාරය – සෘජු පිරිවැය**

| | | |
|---|---|---|
| මුලු අයභාරය | = | රු. 50,000 |
| මුලු සෘජු පිරිවැය | = | (රු. 6,250) |
| **ගිණුම්කරණ ලාභය** | **=** | රු. **43,750** |

**ආර්ථික ලාභය = මුලු අයභාරය – (සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය)**

| | | |
|---|---|---|
| මුලු අයභාරය | = | රු.50,000 |
| මුලු සෘජු පිරිවැය | = | (රු.6,250) |
| මුලු වක්‍ර පිරිවැය | = | (රු. 1,200) |
| **ආර්ථික ලාභය** | **=** | රු.**42,550** |

***(ලකුණු 04)***

***(මුළු ලකුණු 10 යි)***

## *හතරවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරː*

**(a) පටු මුදල් සැපයුම හා පුළුල් මුදල් සැපයුම අතර වෙනස**

**පටු මුදල් සැපයුම (M1)**

ගනුදෙනු චේතනාව සඳහා පවත්වා ගන්නා විනිමය මාධ්‍යයක් ලෙස යොදාගත හැකි මුදල් මෙයට අයත් වේ.

$$\mathbf{M_1 = C_P + DD_P}$$

M1 = පටු මුදල් සැපයුම

Cp = මහජනතාව සතු ව්‍යවහාර මුදල්

DDp = මහජනතාව සතු වාණිජ බැංකු වල ඇති ඉල්ලුම් තැන්පතු

aat SRI LANKA

පුලුල් මුදල් සැපයුම (M2)

පටු මුදල් සැපයුමට අයත් සියලුම අයිතම සහ ආරක්ෂණ චේතනාව සඳහා පවත්වා ගන්නා වටිනාකමේ සංනිධියක් ලෙස යොදාගත හැකි මුදල් මෙයට අයක් වේ.

$$M_2 = M1 + TSDp$$

M2 = පුලුල් මුදල් සැපයුම
M1 = පටු මුදල් සැපයුම
TSDp = මහජනතාව සතු වාණිජ බැංකු වල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතු

*(ලකුණු 03)*

**(b)**

**(i)** විද්‍යුත් මුදල්

ඉලෙක්ට්‍රොනිකව පමණක් හුවමාරු කල හැකි මුදල් හෝ පත්‍රිකා විද්‍යුත් මුදල් ලෙස හැඳින්වේ. සාමාන්‍යයෙන් පරිගණක ජාල, අන්තර්ජාලය සහ ඩිජිටල් වටිනාකම් ගබඩා කිරීමේ පද්ධති හරහා මේවා ක්‍රියාත්මක වේ. ඉලෙක්ට්‍රොනික මුදල් හුවමාරු කිරීම සහ ඍජු තැන්පතු විද්‍යුත් මුදල් වලට උදාහරණ වන අතර මේවා ඊ බැන්කින් සහ ඊසි කෑෂ් ක්‍රමවලදී බහුලව භාවිතා වේ.

*(ලකුණු 02)*

**(ii)** විද්‍යුත් මුදල් භාවිතය සඳහා හේතු

- පහසුවෙන් හා ඉක්මනින් ගෙවීම් පාරිභෝගිකයන් ආකර්ෂණය කර ගැනීම
- ජාත්‍යන්තර ගනුදෙනු සිදු කල හැකි වීම
- භෞතික මුදල් වලට වඩා ආරක්ෂාකාරී වීම
- බැංකු අභ්‍යන්තර ජාල සඳහා සම්බන්ධ විය හැකි වීම
- වාණිජ්‍ය ආයතන අතර පවතින තරඟකාරීත්වය නිසා
- අඩු ගනුදෙනු පිරිවැය
- ගනුදෙනු විස්තර සොයාගැනීමේ පහසුව *(ලකුණු 03)*

**(c)** ප්‍රමාණාත්මක මූල්‍ය පාලන උපකරණ

- බැංකු පොළී අනුපාතය
- ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය
- විවිට වෙළඳපොල කටයුතු

*(ලකුණු 02)*
*(මුළු ලකුණු 10 යි)*

## *පස්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

**(a)**

**(i)** උද්ධමනයේ ආර්ථික ප්‍රතිවිපාක

**ඉතිරිකරන්නන්ට අයහපත් වීම** - උද්ධමනයත් සමඟ නාමික පොළී අනුපාතය වෙනස් නොවන නිසා එම පොළී ආදායමේ මූර්ත අගය අඩුවේ. මේ උද්ධමනයකදී පුද්ගලයන් ඉතිරි කිරීමට ධෛර්මත් නොවේ.

**ණයහිමියන්ට අවාසිදායක වන අතර ණයගැතියන්ට වාසිදායක වීම** - ණයහිමියා වර්තමානයේ ණය වශයෙන් ලබාදෙන මුදලේ මූර්ත අගය නැවත ලැබෙනවිට උද්ධමනයකදී අඩුවී තිබීම නිසා උද්ධමනය ණයහිමියන්ට අවාසිදායක වේ. මෙම අවාසිය මඟහරවා ගැනීමට ණය ගණුදෙනු වලදී පොළියක් අයකළ හැකිය. කෙසේ වෙතත් පොළී අනුපාතයට වඩා උද්ධමන අනුපාතය ඉහළ අගයක පවතී නම් එහිදී නැවතත් ණයහිමියන්ට අවාසිදායක වේ.

**ආර්ථික තීරණ ගැනීමේ ක්‍රියාවලිය විකෘති වීම** - උද්ධමනයකදී පාරිභෝගිකයින්ගේ වැය කිරීමේ හැකියාව අඩු වේ. එම නිසා ඉක්මනින් මිල වෙනස් වන තත්ත්වයක් තුල පාරිභෝගිකයන් සුඛෝපභෝගී භාණ්ඩ වෙනුවෙන් කරන වැය කිරීම් නවතාලයි. මිල, තීරණ ගැනීමේදී අදාල වන ප්‍රධානතම සාධකය බවට පත්වේ. උද්ධමනය භාණ්ඩ හා සේවාවල මිල මට්ටම් වෙනස් කිරීමෙන් විකෘති කිරීම් වලට තුඩු දිය හැකිය.

**ආදායම් ව්‍යාප්තිය අයහපත් වීම** - උද්ධමනයෙන් පහළ හා මධ්‍යම ආදායම් ලබන වැටුප් ලබන සේවකයන්ගේ ජීවන තත්ත්වය පහත වැටෙයි. නමුත් ඉහළ ආදායම් ලබන ව්‍යාපාරිකයන්ට ඇති වන්නේ අවම බලපෑමකි. ඒ අනුව පහළ ආදායම් ලාභීන්ගේ ජීවන මට්ටම පහළ ගොස් ඉහළ ආදායම් ලාභීන්ගේ ජීවන මට්ටම තවත් ඉහළ යාමෙන් ආදායම් බෙදී යාමේ විෂමතාවය වැඩිවේ.

**නිරපේක්ෂ දරිද්‍රතාවය ඉහළ යාම** - උද්ධමනයකදී භාණ්ඩ හා සේවා වල මිල ගණන් ඉහළ ගියද ඊට සාපේක්ෂව දිළිඳු ජනතාවගේ වැටුප් ඉහළ නොයයි. එම නිසා නිරපේක්ෂ දරිද්‍රතාවය ඉහළ යයි.

**අපනයන වල තරගකාරීත්වයට බාධා ඇති වීම** අපනයනය සඳහා නිපදවන භාණ්ඩ හා සේවා නිපදවීමේ පිරිවැය ද ඉහළ යන නිසා අපනයනය කරන භාණ්ඩ සේවාවන් වෙනුවෙන් අපනයනකරුවන් වැඩි මිලක් අයකරයි. එම නිසා ලෝක වෙළඳපොලේ අපනයන භාණ්ඩ වල තරගකාරිත්වය පහත වැටේ.

**පුද්ගලයන්ගේ ජීවන වියදම ඉහළ යාම** උද්ධමනකාරී තත්ත්වයක් තුළදී සියලුම භාණ්ඩ හා සේවා මිල ගණන් ඉහල යාම නිසා ජීවන වියදම ඉහළ යයි. ඉහළ යන භාණ්ඩ මිලට සරිලන ලෙස වැටුප් ඉහළ නොගියහොත් පාරිභෝගිකයන් සතු මුදල් වල අගය පහල යනු ඇත. උද්ධමනය මධ්‍යම පාන්තිකයන්ට අහිතරකර වන අතර දිළින්දන්ට අතිශය හානිකර තත්ත්වයන් ඇති කරයි.

**විනිමය අනුපාත ක්ෂය වීම** - උද්ධමනකාරී පරිසරයක් තුල අපනයන අඩුවී ආනයන වැඩිවීමේ ප්‍රතිපලයක් ලෙස ගෙවුම් ශේෂ ලේඛණයේ වෙළඳ ගිණුමේ හිඟය පුළුල් වේ. තවද එම නිසා විනිමය අනුපාත ද ක්ෂය වීමකට ලක්වේ.

***(ලකුණු 04)***

aat SRI LANKA

**(ii) උද්ධමනය අවම කිරීම සඳහා රටක් විසින් ගත යුතු පියවර**

- සමාහාර ඉල්ලුමෙහි වර්ධනය සීමා කිරීම
- සමාහාර සැපයුමෙහි වර්ධනය වේගවත් කිරීම
- කාර්යක්ෂම සම්පත් බෙදාහැරීමක් සඳහා පවතින බාධා ඉවත් කිරීම
- රජයේ වියදම් අඩු කිරීම
- සංකෝචනාත්මක මූල්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම
- සංකෝචනාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම
- මුදල් සැපයුම පාලනය කිරීම

*(ලකුණු 02)*

**(b) සාපේක්ෂ වාසි න්‍යාය**

සාපේක්ෂ වාසි තීරණය කිරීම සඳහා භාණ්ඩ ඒකකයක ආවස්ථික පිරිවැය ගණනය කල යුතු වේ.

| රට | ලූණු නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය | අල නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය |
|---|---|---|
| ඉන්දියාව | 9/ 18= 0.5 | 18/9= 2 |
| පාකිස්ථානය | 4 /2 = 2 | 2 / 4= 0.5 |

ඉහත වගුවට අනුව අවම ආවස්ථික පිරිවැයක් යටතේ ඉන්දියාව ලූණු නිෂ්පාදනයේ නිරත වන අතර පාකිස්ථානය අවම ආවස්ථික පිරිවැයක් යටතේ අල නිෂ්පාදනය කරයි.

ඒ අනුව,

- ලූණු නිෂ්පාදනයේ සාපේක්ෂ වාසිය ඉන්දියාව සතුවේ.
- අල නිෂ්පාදනයේ සාපේක්ෂ වාසිය පාකිස්ථානය සතුවේ.

*(ලකුණු 04)*
*(මුළු ලකුණු 10 යි)*

***B කොටසෙහි අවසානය***

SRI LANKA

*(මුළු ලකුණු 20 යි)*

**C කොටස**

## *හයවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

**(A)** සාර්ව ආර්ථික ප්‍රතිපත්ති

**මූල්‍ය ප්‍රතිපත්තිය** - මහ බැංකුව සාර්ව ආර්ථික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්තිය භාවිතා කරයි. මුදල් සැපයුම සහ පොළී අනුපාතය මුදල් ප්‍රතිපත්තියේ ප්‍රධාන මෙවලම් වේ.

**ෆිස්කල් ප්‍රතිපත්තිය** - සාර්ව ආර්ථික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රජය ෆිස්කල් ප්‍රතිපත්තිය භාවිතා කරයි. මෙම ප්‍රතිපත්තිය භාවිතා කරයි. මෙම ප්‍රතිපත්තිය හරහා ආදායම්, රජයේ වියදම් සහ රාජ්‍ය ණය වෙනස් කිරීමට කටයුතු කරයි. රජයේ වියදම්, බදු සහ රාජ්‍ය ණය පිළිබඳව ගනු ලබන තීරණ රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග ලෙස සැලකේ.

**සැපයුම් පාර්ශවීය ප්‍රතිපත්ති** - මෙම ප්‍රතිපත්ති සැලසුම් කර ඇත්තේ රටක නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම සඳහා වන අතර එමගින් සමස්ථ සැපයුම ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ප්‍රසාරණය කිරීම අරමුණු කර ගනී. බදු ප්‍රතිසංස්කරණ, නියාමනහරණය, පෞද්ගලීකරණය, ප්‍රාග්ධන වෙළඳපොල හා ශ්‍රම වෙළඳපොල ප්‍රතිසංස්කරණ වැනි මෙවලම් යොදා ගැනේ.

**විදේශ වෙළඳ ප්‍රතිපත්තිය** - හිතකර වෙළඳ ශේෂයක් පවත්වා ගැනීම සඳහා නිදහස් ජාත්‍යන්තර වෙළඳාමට බලපෑම් කිරීමට විදේශ වෙළඳ ප්‍රතිපත්තිය ලෙස හැඳින්වේ. තීරු බදු, අපනයන සහනාධාර, ආනයන කෝටා, විනිමය අනුපාතිකය වෙනස් කිරීම මෙවලම් මේ සඳහා යොදා ගැනේ.

**ඍජු පාලන ප්‍රතිපත්තිය** - නිදහස් වෙළඳාමට මැදිහත් වීමට රජය ගන්නා ක්‍රියාමාර්ග, නිෂ්පාදන සම්පත්වල හිමිකාරීත්වය සහ බෙදාහැරීම පාලනය කිරීම අරමුණු කරගත් ක්‍රියාමාර්ග සහ වෙළඳපොල බලවේග හරහා තීරණය වන මිල පාලනයන් ආදිය මෙයින් අදහස් වේ.

**ආදායම් ප්‍රතිපත්තිය** - ආර්ථිකයේ උද්ධමන පීඩනය මැඩපැවැත්වීම සඳහා වැටුප් අනුපාත සහ මිල මට්ටම පාලනය කිරීම සඳහා රජය යොදා ගන්නා ප්‍රතිපත්ති වේ.

***(ලකුණු 04)***

**(B)**

**(i)**

| | අයිතමය | | රු.මිලියන |
|---|---|---|---|
| 1. | සේවක ආදායම් | = | 50,000 |
| 2. | දළ මෙහෙයුම් අතිරික්තය | = | 25,000 |
| 3. | මිශ්‍ර ආදායම් | = | 10,000 |
| 4. | නිෂ්පාදනය මත අනෙකුත් බදු අඩු කලා සහනාධාර | = | 5,000 |
| | ***මූලික මිලට දළ එකතුකල අගය (GVA) 1+2+3+4*** | = | **90,000** |

***(ලකුණු 05)***

**(ii)**

| | | | |
|---|---|---|---|
| 5. මූලික මිලට දළ එකතුකල අගය | | = | 90,000 |
| 6. නිෂ්පාදනය හා ආනයනය මත ශුද්ධ බදු | | = | 4,500 |
| ***වෙළඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය*** | **(5+6)** | = | **94,500** |

*(ලකුණු 02)*

**(iii)**

| | | |
|---|---|---|
| 7. වෙළඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය | = | 94,500 |
| 8. ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම | = | 15,000 |
| 9 ***වෙළඳපොළ මිලට දළ ජාතික ආදායම*** **(7+8)** | = | **109,500** |

*(ලකුණු 02)*

**(c) සෘජු බද්දක් හා වක්‍ර බද්දක් අතර වෙනස**

බද්දට යටත් වන පුද්ගලයා හෝ ආයතනය විසින්ම හෝ අදාළ බද්ද ගෙවීමට සිදුවන අතර එය වෙනත් පාර්ශවයකට විතැන් කළ නොහැකි බදු සෘජු බද්දක් ලෙස හැඳින් වේ. මෙහිදී බද්දට යටත් වන පුද්ගලයාම බදු බර දරා ගත යුතු වේ. නිදසුනක් ලෙස ආදායම් බදු හා දේපළ බදු දැක්විය හැකිය.

යම් බද්දක් ගෙවීමට නෛතිකව නියම වූ පුද්ගලයා විසින් එම බදු බර වෙනත් අයෙකු මත විතැන් කරනු ලබයි නම් එය වක්‍ර බද්දක් ලෙස හැඳින්වේ. නිදසුනක් ලෙස එකතු කල අගය මත බදු දැක්විය හැකිය.

*(ලකුණු 03)*

**(d)**

- නොවිධිමත් ආර්ථිකයේ පවතින ඵලදායී ආර්ථික කටයුතු ඇතුළත් නොවීම
- යැපුම් ආර්ථික කටයුතු ජාතික නිෂ්පාදනය තුළ ඇතුළත් නොවීම
- ගෘහණියකගේ සේවාවන් ජාතික නිෂ්පාදනය තුළ ඇතුළත් නොවීම
- රාජ්‍ය ණය මත ගෙවූ පොළී ජාතික නිෂ්පාදනය තුළ ඇතුළත් නොවීම
- නිෂ්පාදන කටයුතු මඟින් පරිසරයට වූ බලපෑම සැලකිල්ලට නොගැනීම
- රාජ්‍ය සේවාවන් වල ඵලදායීතාවයේ වෙනස් වීම් සැලකිල්ලට නොගැනීම
- ආරක්ෂාව සහ යුද්ධය වෙනුවෙන් වැය කල මුදල් ඵලදායී නිෂ්පාදන කටයුත්තක් ලෙස ඇතුළත් කිරීම
- දිගු ජීව කාලයක් සහිත ඇතැම් පාරිභෝගික භාණ්ඩ ආයෝජනයක් ලෙස ඇතුලත් නොකිරීම

*(ලකුණු 04)*

*(මුළු ලකුණු 20 යි)*

***C කොටසෙහි අවසානය***

aat SRI LANKA

## *Notice:*

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.

These should be understood as Suggested Answers to questions set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers". The fundamental objective of this publication is to add completeness to its series of study texts, design especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well and stay relevant in the art of answering questions at examination level.

*© 2021 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*